
# හත්ථිපාල ජාතකය



සම්පාදක

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි

ශ්‍රී ඥාණාරාම යෝගාශ්‍රමය,
කාවන්තිස්සගම, තිස්සමහාරාමය.

# සසර දුකකි නිවන සැපතකි

ගොනු පසුපස රථ රෝදය පෙරළෙන වා
කල කම් පල එලෙසම මතු පල දෙන වා
පින පව දෙකම බව කතරට එක්වෙන වා
බව දුක නිසා බව සයුරෙහි පීනන වා

කරුමය තමයි අපහට නිති හිමි වන් නේ
උරුමය එයයි පින පව තුළ පවතින් නේ
පින් පව් දෙකම බව දුක ලෙස සැලකෙන් නේ
බව දුක නිමාකර නිවනින් සැනසෙන් නේ

උපතත් සමග මරණය ගෙන එන්නේ ය
මැරුණත් නැවත උපතක් ගෙන දෙන්නේ ය
මැරෙමින් උපදිමින් සසරෙහි යන්නේ ය
මරණය මරා බව දුක ජය ගන්නේ ය

*සිරිපාල සරණතිලක බලංගොඩ*

# හත්විපාල ජාතකය

සම්පාදක

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි

# සංස්කාරක හිමිගෙන්...

මෙම දහම් ග්‍රන්ථය සම්පාදනය කරනු ලැබුයේ ක්‍රි.වර්ෂ 2010-08-12 උතුරු කළුතර ශ්‍රී කල්‍යාණ ධර්මාශ්‍රමයේ වස්වසා සිටින සමයේය. එතෙක් මෙතෙක් මෙම ග්‍රන්ථය ඇතුළු තවත් ඉතා අගනා කලානුරූප යටපත් වී ගෙන යන ධර්මය ලෝවැසි සත්වයන් අතරට පත් කිරීමට අනුග්‍රාහකයන් නොමැති අවස්ථාවක මාගේ ගුරුදේවයන් වහන්සේ වූ පූජ්‍යපාද කහගොල්ලේ සෝමවංස මාහිමි පාදයන් වහන්සේගේ 2012-12-18 වැනි හතලිස් හත්වැනි සුභ උපන්දින සැමරීමේ මහඟු කාර්‍යය සඳහා අනුග්‍රහය ලබා දුන්නා වූ මාගේ ඥාතීන්ටත් විශේෂයෙන් එම ඥාතීන්හට තව තවත් මෙවන් ධර්ම ග්‍රන්ථ සමාජය අතට පත් කිරීම සඳහා අනුග්‍රහය ලබාදුන්නා වූ නෙරන්ජන් විතානාරච්චි මහතා සහ එම මහතාගේ සහෝදරයා වූ රුචිර විතානාරච්චි දෙසොහොයුරන් විසින් මීට වර්ෂ 18 කට පෙර මිය පරලොව ගියා වූ තම පියාණන් වහන්සේගේ පරලොව ගමන සාර්ථක වීමටත්, ලෝකයේ උතුම්ම දනය වූ ධර්ම දනයේ පුණ්‍ය මහිමයෙන් සසර වසන තුරු නිවන් දක්නා ජාති දක්වා සතර අපා දුකකට පත් නොවී ඉතා ඉක්මන් භවයකින්ම සංසාර දුකින් මිදී අජරාමර නිවන් සැප ලැබීමට මෙම කුසලය හේතු වාසනා වේවා!!! යි ප්‍රාර්ථනා කරන අතර ජීවත්ව සිටින එම පුතුන් දෙදෙනාගේ මෑණියන් වහන්සේ වන මල්ලිකා විතානාරච්චි උපාසිකාවගේ ආදරණීය ස්වාමිපුරුෂයාණන් වහන්සේ වන මුනිදාස විතාරනආරච්චි මහතාට එතුමිය විසින් මෙතෙක් රැස්කර ගත් කුසල් ද අනුමෝදනා කරමින් ප්‍රාර්ථනා කරනුයේ ඔබගේ භව ගමන ඉක්මන් භවයකින්ම අවසන් කර අජරාමර නිවන් සැපතටම පත්වේවා!!! යි සිහිපත් කරමිනි.

තවද පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමියන්ගේ ඥාතීන් විසින් ද වර්තමානයෙහි සම්බුද්ධ ශාසනයට ඉතා උසස් ආදර්ශමත් සේවයක් කරන අපගේ ගරු පූජණීය කහගොල්ලේ සෝමවංස මාහිමිපාණන් වහන්සේගේ සුබ උපන්දිනයන් දෙකක් වෙනුවෙන් මෙවන් ධර්ම ග්‍රන්ථයන් සම්පාදනය කර ජනතාව අතරට පත් කිරීමටත් ගුරු ගෞරවය තැබීමටත් මෙම ශ්‍රී කල්‍යාණ යෝගාශ්‍රමාධිපති අපවත්වී වදාළ කඩවැද්දුවේ පණ්ඩිත මාහිමිපාණන් වහන්සේගේ ප්‍රාර්ථනාව වූ උතුම් බුදු බවට පත්වීමටත්, එම සංස්ථාව මැනවින් ඉදිරියට ගෙනයන ආදර්ශමත් සංඝ පීතෘන් වහන්සේ නමක් වූ නා උයනේ මහා ස්වාමිපාදයන් වහන්සේටත් ප්‍රාර්ථනා කරන බෝධියකින් ඉක්මන් භවයකින්ම සසර දුකින් මිදීමට මෙම ධර්ම දනමය කුසල් බලය ද හේතු වාසනා වේවා!!! යි ප්‍රාර්ථනා කරමු. එසේම මෙම ශ්‍රී කල්‍යාණ යෝගාශ්‍රම සංස්ථාව ආදර්ශමත් ඉදිරියට ගෙනආ අපවත් වී වදාළ සියලුම සංඝ පීතෘන් වහන්සේලාටත්, සිවුපසයෙන් ඇප උපස්ථාන කර මිය පරළොව ගියාවූ දයක කාරකාදීන්ටත් පරළොව ගමන සාර්ථක වේවා!!! යි පතමි.

මීට මෙතැති
**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි**
ශ්‍රී ඥානාරාමය, කාවන්තිස්සගම,
තිස්සමහාරාම.

2012-11-22

# නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස!!!

# හත්විපාල ජාතකය

## නමෝ බුද්ධාය

තවද එක්සමයෙක්හි ත්‍රිභුවන භවන ප්‍රදීපායමානතියා ගුණ පරම්පරා විරාජිත ශ්‍රී ශාක්‍යසිංහ අප භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවස්තිපුර සමීපයෙහි වූ ප්‍රඵුල්ල තරුවර නිකර විරාජිත ජේතවනාරාමයෙහි වැඩ වසනසේක් තමන් වහන්සේගේ මහාභිනිෂ්ක්‍රමණයක් අරභයා වදාළ සේක.

ඒ කෙසේද? යත්

යටගිය දවස බරණැස් නුවර ඒකායුකාරි නම් රජතුමෙක් දසරාජ ධර්මයෙන් රජ කරණු වැලිකෙළියෙහි පටන් එක්ව වැඩී පුරෝහිත ධූරයට පැමිණි බ්‍රාහ්මණයා හා එක්ව සිය සැපත් විඳිනේය. එතකුදුවත් ඔවුන් දෙදෙනාටම දරු සම්පතක් නැත. මෙසේ සමවාසය කරන්නා වූ රජ්ජුරුවෝ හා පුරෝහිත බ්‍රාහ්මණ තෙම එක් දවසක් සතුටු කථාවෙන් යුක්තව උන්නාහු ''මිත්‍ර පුරෝහිතයාණනි, සියලුම යස ඉසුරු සම්පතින් පිරුණා වූ අපට දරු සම්පතක් නැත්තාහ. සබඳ පුරෝහිතය, තොපට පුතණුකෙනෙක් උපන්නාහු නම් තොපගෙ සම්පතටත් රාජ්‍යයටත් හිමි වන්නාහ. මෙසේ ඒ දෙදෙන ගිවිසුම් ඇති කර ගත්හ.

මෙසේ දෙදෙන එසේ ගිවසුම් ඇතිකර සතුටින් වසන අතර එක දවසක පුරෝහිත බ්‍රාහ්මණ තමාගේ ගමට ගොස් නැවත නුවරට එනුයෙ දකුණු දිග වාසලින් නුවරට එනුයේ නුවරින් පිටත්වන බහුපුත්තික නම් එක් දිළිඳු ස්ත්‍රියක් යනු දුටුවේය. ඇයට නිදුක් නිරෝගි සුවපත් දරුවන් හත් දෙනෙක් සිටියහ. එයින් එකෙකු අත හිඟමන් යදින කබලය එකෙකු අත බිම නිදා ගන්නා කලල් රෙද්දය එයින් එකෙක් ඉදිරියෙන් ද එකෙක් පසුපස ද යයි. එකෙක් ඇඟිල්ල අල්ලාගෙණ යයි, එකෙක් උකුලේ වඩාගෙණය, මෙසේ එම දරුවන් සත් දෙනා සමග යන ඒ දිළිඳු ස්ත්‍රිය එම පුරෝහිත බ්‍රාහ්මණයා සමීපයෙන් යන්නීය. එකල්හි බමුණු

ඇයගෙන් මෙසේ විමසීය. ''එම්බල භද්‍රාව, මේ දරුවන්ගේ පියා කොයිද්දැයි'' විචාළේය. එකල්හි ඕතුමු කියන්නී ''ස්වාමීනි, මේ දරුවන්ගෙ පියා අසවලායයි කියන්ට කෙනෙක් නැත.'' එසේනම්, තී මෙවන් දරුවන් සත් දෙනෙකු කෙසේ ලද්දේද''යි විලාළේය. එකල්හි ඒ අසරණ ස්ත්‍රිය කියන්නේ මේ මේ කාරණයෙන් දරුවන් ලද්දෙමියි කියන්ට කිසි කාරණයන් නොදන්නී නුවර වාසල්දෙර සමීපයේ මහත් නුග ගසක් දක්වා'' ස්වාමීනි, පුරෝහිත බ්‍රාහ්මණයාණන් වහන්ස, මේ නුගරුකෙහි අධිගෘහිත දේවතාවා සමීපයෙන් ලදිමියි කීය.

එසඳ පුරෝහිත බමුණු ඈ කී බස් අසා යහපතියි කියා ඈ පිටත්කර හැරියේය. ඉන්පසු එතුමා රථයෙන් බැස නුග ගස මුලට පැමිණ අත්තක් අල්ලා එය සොලවා කියනුයේ පින්වත් දිව්‍ය පුත්‍රය, මේ රාජ්‍යයෙ රජ තුමාගෙන් ඔබට මොනවා ලබා ගන්න බැරිද? අවුරුදු පතා දහස් ගණනින් වියදම් කොට විශාල පූජා සත්කාරයන් කරවන සේක. සියළු රාජ්‍යවාසින් ඔබට නොයෙක් පූජාවන් කරන සේක. එසේ වූ උන්වහන්සේට දරු සම්පත් නොදී කිසි පූජාවක්වත් පඬුරක්වත් දීගත නොහැකි නොදෙන අර දිළිඳු තැනැත්තියට කුමක් නිසා දරුවන් සත් දෙනෙකු දුන්නෙහිද? අපේ රජතුමාටත් පුත්‍ර රත්නයක් ලබා නොදුනහොත් දවස් හතක් ගිය තැන මෙම ගස කපා මුල්පිටින් ගලවා ඉවත්කරමි, යි කියා රුක් දෙවියා බියගන්වා නික්ම ගියේය. මෙයාකාරයට නොකඩවා දවස් හයක්ම එම නුග ගස මුලට ගොස් තර්ජනය කර ආවේය. සත්වන දවසත් පැමිණ අද රාත්‍රි පහන්වීමට පෙර අපගේ රජතුමාට පුත්‍ර රත්නයක් ලබා නොදුනහොත් හෙට උදේට මේ වෘක්ෂය අවසානය බව දැනගන්නැයි කියා නික්ම ගියහ.

මෙලෙස කියා පුරෝහිත බ්‍රාහ්මණයා නික්ම ගිය පසු රුක්දෙවියා විමසා බලා, පුරෝහිතයා කී ආකාරයටම මෙම වෘක්ෂය කපා විනාශකරන බව දැන මේ බමුනාට දරුවන් නොදුනහොත් මාගෙ විමානය නැතිවන්නේය. මොන උපක්‍රමයකින් ඔහුට දරු සම්පතක් දිය හැකි දෝයි සිතා සතරවරම් රජදරුවන් සමීපයට ගොස් පුරෝහිතයා කීබස් සතරවරම් දෙවියන්ට කීවේය. එවිට වරම් රජදරුවන් කියන්නේ අපට ඔහුට දරුවන් දීමට පුළුවන් කමක් නැත. එවිට එම දිව්‍යපුත්‍රයා එතනින් නික්ම, සාතාගිරහේමවත අටවිසි යක්ෂ සේනාපතියන්ටත් බමුණාගෙ අදහස ඉෂ්ට කිරීමට බැරිනිසා එම යක්ෂ සේනාධිපතිහුද එම දිව්‍ය පුත්‍රයා සමගින් සක් දෙව්රජ තුමාට ගොස් සියළු පවත් පැවසූහ. එවිට සක්

දෙව්රජතුමා බමුණාට පුත්‍රයෙකු ලැබේදෝයි බලනුයේ, මහත් පින් බල ඇති දිව්‍ය පුත්‍රයන් හතර දෙනෙකු දුටුවේය. මොවුන්ගේ පින් බලය කෙසේද යත්, ඔවුන් හතරදෙනා පූර්ව ආත්මභාවයකදී බරණැස් නුවර පේසකාරව සිට සතරදෙනා සමගිව එක් රැස්කර ගන්නා වූ ධනය කොටස් පහකට බෙද එක් කොටසක් දන් පින් පිණිස වැයකර එම ආත්ම භාවයෙන් පසුව ආයු පමණින් තවුතිසා දිව්‍ය ලෝකයේ සිට පරනිම්මිත දිව්‍ය ලෝකය දක්වාත් දිව සැප විඳිමින් සැරිසරන්නේ.

එදවස් තව්තිසා දෙව්ලොවින් යාම දිව්‍ය ලෝකයට උපදින්ට සිටියහ. එසඳ සක්දෙව් රජහු ඔවුන් කරා ගොස් නිදුක්නි තොප මිනිස්ලොවට ගොස් ඒ සුකාරි රජ්පුරුවන්ගේ අග මෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳනට වටිනේයයි දන්වූහ. එවිට දිව්‍ය පුත්‍රයෝ සතර දෙනා සක්දෙව් රජුගේ බස් අසා යහපත දෙවියන් වහන්ස ඔබ වහන්සේ වදළ නිසා යම්හ, එසේ වුවත් රජකුලයෙහි ඉපදීමෙන් ප්‍රයෝජනයක් නැත පුරෝහිත බමුණන්ගේ ගෙයි ඉපිද බාල අවස්ථාවෙහිම පඤ්චකාම සැපත් හැර පැවිදිව වසම්හයි කීහ. සක්දෙව් රජ්පුරුවොත් යහපත තොපගෙ කැමැත්ත සේම වේවායි කියා ඔවුන්ගෙන් ප්‍රතිඥා ගෙන අවුත් ඒ රුක් දෙවියාට එම පුවත කීවේය.

එවිට සතුටට පත් දිව්‍ය පුත්‍රයා සක් දෙව් රජහු වැඳ තමාගෙ විමානයට ගියේය. පුරෝහිත බමුණා පසුද සෙනක පිරිවරා ගස කපා ඉවත් කිරීමට උවමනා ආයුධ සමග පැමිණ එම නුග ගසෙ අත්තක් අල්වා ගෙන පින්වත් දිව්‍ය පුත්‍රය, පුත්‍ර සම්පතකට ප්‍රාර්ථනා කරන්නා වූ මට අදට දින හත සම්පූර්ණය. දැන් මම මේ ආවේ ඔබ මගෙ ඉල්ලීම ඉටු නොකළහොත් මෙම වෘක්ෂයෙ අවසානය දකින්නට ඊට පෙර මගෙ ඉල්ලීම වෙනුවෙන් ඔබට යමක් කීමට තිබේ නම් කියන්නැයි කීහ.

එවිට එම වෘක්ෂයට අධිගෘහිත දිව්‍ය පුත්‍රතෙම මහත් වූ දිවය ආනුභාවයෙන් අතුපතර අතරින් අර්ධ ශරීරයක් දක්වා මිහිරි කටහඬින් ඔහුට ආමන්ත්‍රණය කොට සබඳ පුරෝහිත බ්‍රාහ්මණය, තොප එක පුතෙකුටයි යාච්ඤා කළේ තට පුතුන් සතර දෙනෙකුම දෙමියි කීවේය. එවිට බමුණා මට දරුවන්ගෙන් කම් නැත, අපගේ රජතුමාට දුන මැනවයි කියා නැවතත් දේවතාවා කියනුයේ මා දරුවන් දෙන්නේ තොපටමයි කියත්ම, එසේ නම් මට දරුවන් දෙදෙනෙකුත් රජ්පුරුවන් වහන්සේට දෙදෙනෙකුත් දුනමැනවයි කීවේය.

නැවතත් දිව්‍ය පුත්‍රයා කියනුයේ බ්‍රාහ්මණය, දරුවන් හතර දෙන්නේ තටය තොප දරුවන්ගේ අයිතිකරු පමණක් විනා එම දරුවන් බාල කාලයේදීම

ගිහිගෙයින් නික්ම පැවිදිවෙතියි කියා සිටියේය. එබසට පුරෝහිත කියා සිටියෙ ඔබ දරුවන් ලබාදෙන්න පැවිදිවීම් අපට භාරයි කියා එවිට දිව්‍ය පුත්‍රයා ඔහුට පුත්‍ර වරය දී තම විමානයට වන්හ. එතැන් පටන් දිව්‍ය පුත්‍රයාට මහත් පූජා සත්කාර විය. දෙව්ලොව පෙසකාර දිව්‍ය පුත්‍රයන් සතර දෙනාගෙන් ප්‍රධාන දිව්‍ය පුත්‍රයා පළමුවෙන් චුතව පුරෝහිත බමුණාගෙ බැමිණි දේවිය කුස පිළිසිඳ ගත්තේය. ඔහු උපන් දවස් හත්ථිපාල කුමාරයෝයයි නම් තබා පැවිදිවීම වැලැක්වීම පිණිස ඇත් ගොවුවන් හා කැටිව එක්ව වැඩෙන නියාවෙන් ඇත්තලයන්ට භාර කළහ. ඔහු පියනගා ඇවිදින කල දෙවන දිව්‍ය පුත්‍ර දෙව්ලොවින් චුතව එම මැණියන් කුස පිළිසිඳ ගත. ඔහු උපන් කල්හි අශ්වපාල කුමාරයයි නම් තබා අස්ගොව්වන්ට භාර කළහ. තුන්වන කුමාරයා උපන් කල්හි ගෝපාල කුමාරයෝ යයි නම් තබා ගොපල්ලන්ට භාර දුන්හ. හතරවන කුමාරයා උපන් කල්හි අජපාල කුමාර යයි නම් තබා එළුවන් රකින්නන්ට භාර කළහ.

ක්‍රම ක්‍රමයෙන් වැඩී එවුන් සතර දෙනාම වැඩී යහපත් ශරීර සෞන්දර්යයට පැමිණිකල්හි රජතුමාත් පුරෝහිත බමුණාත් මෙකුමරුවන් පැවිදිවෙතියි සිතා තමන්ගේ විජිතයෙහි තපස් චීවරයන් පිටමන් කළහ. ඒසා මහත් කසී රාජ්‍යයෙහි එකද ප්‍රවුජිතයෙක් හෝ නොවීය. මෙම කුමරුවන් මහත් චණ්ඩය පරුෂයහ. අන් සතු දෙය කොල්ල කන තරමටම දරුණුය. හස්තිපාල කුමාරයන් දහසය හැවිරිදි වයසට පැමිණි කල්හි දේහ ලක්ෂණ බලා රජතුමාත්, පුරෝහිත බමුණාත් කියා සිටියේ දූන් කුමාරවරුන්ගේ කල වයස සම්පූර්ණයි. ඔවුන්ට රාජාභිෂේක කරන්ට කුමක් කළ යුතුදැයි කථා කොට මොවුන් ප්‍රසිද්ධියට පත්වෙන කොට සැම දෙසින්ම තපස්වරුන් මොවුන් දැක ගැනීමට පැමිණෙති. එවිට ඔවුන් ඒ තපස්වරුන් කෙරෙහි පැහැදී පැවිදි වෙති. ඔවුන් පැවිදි වූ පසු රාජ්‍යය අවුල් භාවයට පත් වෙයි. එම නිසා පළමු කොට ඔවුන් පරීක්ෂා කර බලා දෙවනුව රාජාභිෂේක කරම්හයි කියා රජ්ජුරුවන් හා පුරෝහිත බමුණන් තවුස් වෙස් ගෙණ ඇවිදිනාහු හත්ථිපාල කුමාරයන්ගේ ගෙදරට ගියාහ. කුමාරයෝ ඔවුන් දැක බොහෝ සෙයින් සතුටට පත්ව වැඳ එකත්පස්ව මෙසේ කීය.

විශිෂ්ඨ වූ ශරීර වර්ණයන් ඇති පාපයෙන් මිදුන හෙයින් බ්‍රාහ්මණ නම් වූ ජටා මණ්ඩලයන් ඇති දඬු කෙණ්ඩි නම් භාරයන් දරන්නා වූ, කාසා වස්ත්‍රයන් දරන්නා වූ චීවරයෙන් වට කොට ඇන්ද වූ තපාස්වර කෙනෙකුන් බොහෝ

කලකින් දිටිමි. එබැවින් ඉඳිනා ආසනද පාදෝනා පැන්ද පයට තෙල්ද අන්නපානාදි සියල්ලම අපගෙන් පිළිගත මැනවයි ආරාධනා කළ සිටියහ. එපරිද්දෙන් හත්ථිපාල කුමාරතෙම තපස් වේශයෙන් ගිය රජතුමාට සහ පුරෝහිතයාට ආරාධනා කළේය. එකල්හි පුරෝහිත බමුණු කියන්නේ එම්හා පුත හත්ථිපාල කුමරයෙනි, තෙපි අප කවුරුන්දැයි නොදැන ද කථා කරන්නේ අප තපස්වරයො නොවෙයි, මේ සිටින්නේ සුකාජි රජ්ජුරුවන් වහන්සේය. මම තොපගෙ පියා වූ රජතුමාගෙ පුරෝහිත බමුණාණෝය යි කීකල කුමරුවො අසන්නේ එසේනම් නුඹ වහන්සේලා කුමක් සඳහා පැවිදි වෙස් ගත් සේක්දැයි විචාළහ.

එවිට ඔවුන් කියනුයේ තොප පරික්ෂා කොට බලා තපසෙහි ආශාවක් නොකලා නම් රාජාභිෂේක කරුණු පිණිස ආම්හයි කීහ. එවිට කුමාරයො පවසන්නේ රාජ්‍යයෙන් මට ප්‍රයෝජනයක් නැත. මාගෙ අභිප්‍රාය පැවිදිවීමයි කීහ. එවිට ඔවුන් දෙදෙන කියන්නේ, හත්ථිපාල කුමාරයෙනි, මේ තොපට පැවිදිවීමට කාලය නොවෙයි. දූන් තරුණ අවස්ථාවෙහි රාජ්‍ය සැප අනුභවකොට පසුව තපස්රක්ෂා කරවයි අවවාද කරනුයේ පුත, තෙපි මේ බාලවයසේ තපසට යන්නේ නම් ළදරු අවස්ථාවෙ වෙදත්‍රයන් ඉගෙන සම්පත් රැස්කොට සැප අනුභවකොට ඒ වංශය රකින්නට නිසි දරු කෙනෙකුන් ඉපිද නිසි වයසට පැමිණි කල්හි ඔහු සැපතෙහි පිහිටුවා තුන් වයසින් අවසාන වයස ගිහි සැප හැර වනගතව තපස් දම් රැකීම යහපතැයි බුද්ධාදි මහොත්තමයන් විසින් ප්‍රශංසා කරන ලද්දේ යයි කීහ. එසඳ හත්ථිපාල කුමාරයෝ කියනුයේ, ඔබ වහන්සේ කියන්නා වූ වේදයෝ නම් අභිමතාර්ථයන් සාද ලියගෙන භව හේතුකොට ගෙන සත්ත නොවන්නාහ. මෙසේ සම්පත්ති ලාභයක් දුක මුල් පමණ විනා ලාභයක් නොවන්නේය. ජරාමරණාදියත් වලකාලිය නොහැකි පරලෙව් හි එලතෙම කුසලා කුසල කර්ම වශයෙන් වන්නේ යයි කී කල්හි නැවත රජ්ජුරුවෝ මෙසේ කියයි.

කුමාරයෙනි, තොප කීයෙ සත්‍ය වචනමය, එසේ වුවත් තොපගෙ දෙමාපිය දෙදෙනා වයෝවෘද්ධයෝය. නිරෝගිව සිටින්නා වූ තොපගෙන් අත් පා මෙහෙවර විඳිනා කැමැත්තාහ කියා එසඳ හත්ථිපාල කුමරු කියනුයෙ දේවයන් වහන්ස, නුඹ වහන්සේ කුමක් කියන සේක්ද මා කොපමණ නිදුක් නීරෝගිව

සිටින්නා වුවත් මා දකින්ට මරු හා විශ්වාසයකුත් මේ සත්වයා මෙතෙක් කලින් මැරෙන නිශ්චයකුත් ඇත්ද ජරාමරණාදීහු නම් නැවක් පදවාගෙන යන පුරුෂයෙක් මහත් උත්සාහයෙන් ප්‍රවාහයෙන් ගලවා නැවත එතරට පමුණුවාද එපරිද්දෙන්ම ජාති ජරා මරණාදීහු මරනු වසඟයට පමුණුවන්නා හු යයි. මෙපරිද්දෙන් සියලු සත්වයන්ගේ ජීවිත සංස්කාරයක්ෂණ භඞ්ගයයි දක්වා, මහ රජ නුඹ වහන්සේ සමග මේ කථා කරමින් සිටියදීම ව්‍යාධි ජරා මරණාදීහු මා වටකර ගන්නාහුයයි සියල සත්වයාට පරලොව නම් ඒකාන්ත කුසල් කිරීමෙහි ප්‍රමාද නොවිය යුතු යයි කියා රජතුමාද තම පියාද වැඳ තම පිරිවරද ගෙණ බරණැසට වන්නාහ.

ඉක්බිති රාජ කුමාරයො පිරිවර සමග පිරිවර සමග තපසට නික්මුණේය. එවිට බොහෝ ජනයෝ මේ පැවිද්ද නම් රජ සැපතටත් වඩා ප්‍රියමනාප දෙයක් වනැයි සිතා හත්ථිපාල කුමාරයන්ගේ පිරිසටම එක්ව තපසට නික්මුණහ. එසේ නික්මගිය පිරිස ගංතෙරකට පැමිණ ඒ ගඟ පළමුවන ජලස්කන්දය ඉකුත්ව තවත් එවන් ජලස්කන්දයක් පැමිණියේය. මෙපරිද්දෙන් ක්ෂණයෙහි මේ ජල ප්‍රවාහය ඉකුත්වන්නාක් මෙන් සත්වයාගේ රූප වර්ණ ආයු සංස්කාරයන් මෙපරිද්දෙන් වහ වහා යන සුලුයයි භාවනා වඩා ධ්‍යාන උපදවාගෙන ඒ හත්ථිපාල කුමාරයා මෙසේ සිතුවේය. මා සමග එන පිරිවර බොහෝය. තවත් මාගෙ මල්ලිලා තුන්දෙනාද දෙමව්පිය දෙදෙනාද රජ යුවරජ ආදිවූ සියල්ලෝම තපස්දම් රක්නට එන්නාහ. බරණැස හිස් වන්නේය. එම නිසා ඒ සැවොම යම් යම් වේලාවක මෙතනට පැමිණෙත්ද? මම ඒ තාක් මෙතනම රැඳෙමියි සිතා කැටුව ආපිරිසට අවවාද අනුශාසනා කෙරෙමින් එහිම නැවතුණේය.

දෙවන දවස් රජතුමාත් බමුණාත් හත්ථිපාල කුමරු කෙරෙහි තිබූ බලාපොරොත්තුව ඉටු නොවූ නිසා, අශ්වපාල කුමාරයන් වෙතද පෙර පරිද්දෙන්ම තපස් වෙසින් ගොස් එකුමරුද පරීක්ෂා කරණුයේ තමාගේ වැඩිමල් සොයුරුගෙ ප්‍රතිපත්තියම අනුගමනය කරමින්, මාගේ වැඩිමල් අයියා සිටියදී මට මොන රාජ්‍යයක්දැයි විමසූ විට රජතුමාත් පිය පුරෝහිත බමුණාත් ඉහත වූ සිද්ධිය මතක්කර දුන්හ. එවිට අශ්වපාල කුමරුවො විමසා සිටියෙ මෙවිට මාගෙ අයියා කොයිදැයි අසා එකුමරු සපිරිවරින් තපසට ගොස් ගංතෙර සිටින බැව් දැන් වූ පසු,

මහරජතුමනි, මපියාණනි, මාගෙ අයියා ඉවත දමාලු කුණු කෙළවලින් මට කාරියක් නැත. මමත් අයියා ගිය මාර්ගයෙහිම යමි. ඔය පිළිකුල් රාජ්‍යයෙන් මට වැඩක් නැතැයි කියා.

මේ ලෝකයෙහි අඥාන අනුවන සත්වයෝ මේ වස්තුකාම කෙලෙස් කාමයන් අත් නොහරින්නේය. මමද ගිහි කම්කටොලු හැර වනගත වෙමි. නැවත එකුමරු එම දෙදෙනාට මෙසේත් කියන්නාහු. උත්තමයාණන් වහන්ස, කාමයෝ නම් එහි ගැලුනාවූ සත්වයෝ පය ඇදගෙණ යා නොදෙන බව හේතුකොට ගෙන මඩගොඩක් සේ සදෘෂයහ. එම මඩ ගොහොරෙහිම ඇලී ගැලී සිටින හෙයින් දුගඳ හමන අපිරිසිදු ජලයක් හා සදෘසයහ. එමනිසා ලාමක සත්ත්වයන් එහිම ඇලී ගැලී සිටින නිසා ඔවුන්ට එයින් මිදීමක් නම් නැත්තේම ය. පිළිකුල් කුණු ගොඩෙ හැදෙන වැඩෙන සත්වයාට එයම රසක් මිහිරක් සේ දැනෙන නිසා බුදු, පසේබුදු, මහ රහතන් වහන්සේලා හොඳයි, සැපයි පෙන්වා වදළ නිවන් රසය, සැපය ලබා ගැනීමේ හේතු වාසනාවක් ඔවුන්ට නැත.

එසේම මමද පෙර ආත්ම භාවයන්හිදි නොව මෙම ආත්ම භාවයෙහිදීම, අස්ගොච්චන් සමග වැඩෙන කල්හි හරි වැරදි, හොඳ නරක, පව පිණ කියාදීමට, අවබෝධ කරදීමට මට කිසිවෙක් නොසිටි බැවින්, මහජනයාගෙන් කොල්ල කෑම්, මැරීම්, තැලීම් ආදියෙන් බොහෝ පීඩා කොට පාපකර්ම අකුසල් රැස් කළෙමි. එබැවින් මේ සංසාරයෙහි සිට අකුසල් නොකොට සුචරිත ධර්මයෙහි හැසිරෙමි. මෙපරිද්දෙන් රජතුමාට සහ බමුණාට නුඹ වහන්සේත් කුසල් කිරීමෙහි ප්‍රමාද නුවුව මැනවයි අවවාද කියා, කථා කරමින් සිටියදීම ව්‍යාධි, ජරා මරණාදිය පැමිණෙන්නේය. කාලය අපතේ හැරීමෙන් ආයුෂ නොගෙවුව මැනවයි කියා දෙදෙනාට වැඳ අවසර ගෙන තපෝවනයට නික්මෙන්ට වන් කල්හි තපස් නම් රජ සැපතටත් වඩා වටිනා දෙයක් වේදැයි සිතා යොදුනක් පමණ දිග ගැවසී ගත් තම පිරවර ගෙන ඒ අශ්වපාල කුමරු තම සහෝදර හත්ථිපාල කුමරුන් උන් තැනටම ගියේය.

එසඳ ගියා වූ මලනුවන්ට ආකාශයෙහි පලක් බැඳ ඉඳ ධර්ම දේශනා කොට අශ්වපාලයෙනි, මේ පිරිසමහත්ය. ඒතාක් මෙතන ඉවුම්හයි කීවේය. ඔවුන්

යහපතයි ගිවිස්වාහ නැවත රජ්ජුරුවන් හා පුරෝහිත බමුණන් දෙවෙනි දවස් ගොපාල කුමරුවන් පරීක්ෂා කොට රාජ්‍යයට පමුණුවම්හයි පෙර සේම තාපස වේශයෙන් ගොස් පෙනී සිටියහ. එහිදීත් එම දෙදෙනාගේ බලාපොරොත්තුව සපල නොවූහ. මාගේ වැඩිමහල් දෙසෝයුරන්ට පිළිකුල් වූ රාජ්‍යයටම ඇති ඵලය කුමක්දැයි කියා බොහෝ කාලයක් මම පැවිදි වීමට බලාපොරොත්තුවෙන් සිටියත් කිසි හසරක් නොදැක උනිම්. දැන් මේ අවස්ථාවේ දී මැරුණු හරකෙක් සොයා ඇවිදිනා කෙනෙක් යම්සේ පියවර සටහන් දැක පාදනුසාරයෙන් ගෙරි සොයා ගනිත්ද එමෙන් බාදනන් වහන්සේ තපසට ගියහ. හසර මා විසින් දක්වන ලදහ. එබැවින් ඔවුන් ගිය හසරින් මමත් යනු කැමැත්තෙමියි කීවේය.

එවිට බ්‍රාහ්මන කියනුයේ කුමාරයෙනි, තොපි දෙදවසක් මෙහි රඳවා අපගේ ශෝක නිවාගත් පසු තපසට යවයි කීහ. එවේලෙහි කුමාර කියනුයේ මහරජ, අද කළමනාකාර්‍ය්‍ය හෙට කෙරෙමි නොකිය යුතුය. අද කළමනා කටයුතු ප්‍රඥවන්තයො හෙටට කල් නොදමති. මරණයෙහි විශ්වාසයක්වත් නිශ්චයෙක්වත් නැත්තේ යයි මෙසේ ගෝපාල කුමාරයො ඔවුන් දෙදෙනාට ධර්ම දේශනා කොට මා කැටිව කාමාසාවෙන් කල් නොයවුය මැනවයි ජාති, ජරා මරණාදිහු වහා පැමිණෙන්නාහයි කියා පියාණන් සහ රජ්ජුරුවන් වැඳ යොදුනක් දිගට එක්රොක්ව සිටි ජනයා සමග නික්ම දෙසොහොයුරන් රැඳී සිටි ගංතෙරට පැමිණියේය. එහි ගියා වූ ගෝපාල කුමාරයන්ට අහසේ පලක් බැඳ වැඩසිටි හත්ථිපාල කුමාරයෝ ධර්ම දේශනා කළහ. මෙපරිද්දෙන් තුන්දෙනා ඒ ගංතෙර තපස් රකින කල්හි නැවතත් රජජුරුවන් හා පුරෝහිත බ්‍රාහ්මණයා පළමු පරිද්දෙන් අජපාල කුමාරයන් වෙතද ගොස් පළමු ආකාරයටම දෙබස්වලින් අනතුරුව, මාගේ වැඩිමහල් සොයුරන් තුන්දෙනා රජකම නැමැති ඉවත දැමූ කුණු කෙළමට ඉස්මුදුණින් පිළිගම්ද? යි කියා සහෝදරයන් ගියමග යාමට සූදනම් විය.

එවිට බමුණු කියනුයේ "පුත තොප තොපගෙ සහෝදරයන් තිදෙනාටම බාලය තොප තවම අප භාරයේ සිටිය යුතු කුඩා දරුවෙකි. එම නිසා තොප වැඩිවී ගිය පසු තපසට යව යි කීපසු "නරදේවේන්ද්‍රයන් වහන්ස, මපියාණන් වහන්ස, ඉපදුන සත්වයාට මරණයට කාල නියමයක් නැත්තේය. කුඩා, තරුණ, මහලු වයස් ප්‍රමාණයක් මාරයාට නැත. මරණයට පත්වන දවස කිසි තැනක

සටහන්ව නැත. අකල් මරණය මේ මොහොත හෝ විය හැක. එමනිසා මම මේ වනවිටත් තපසට ප්‍රමාද වුනෙමි. මහ රජතුමනි, මපියානනි, මම වනාහි ලදරු වූ භාව කටාක්ෂයෙන් යුක්තව නව වන පුළුල් වූ නෙත් සඟලක් ඇති දිව්‍ය ස්ත්‍රියකගෙ රූපයට අපහාස කරණ තරම් රූප ශ්‍රී ඇති පුරුෂ සමාගමයකට නොපැමිණි පඤ්චකාම සැප අනුභව නොකරද ලදරු කුමාරිකාවක දෙමාපියන් දෙදෙනා කෙරෙහි මහත් ශෝක පිහිටුවා මාරයා රැගෙන ගියේය. මෙම සිද්ධිය මම දෑසින් දුටුවෙමි දේවයන් වහන්ස'' කීවේය.

තවද මෙතෙම ලදරුයහ, කුලවත්‍ය ප්‍රියජනකය, බලපරාක්‍රමයෙන් යුක්තය, ඒ කිසිවක් නොබලාම මාරයා ගෙන යන්නේය. එනිසා මම පළමුකොටම මේ සියලු වස්තුකාම, ක්ලේශකාමයන් හැරදමා පැවිදි වෙමි. පැවිදිවන්ට අවසර දුන මැනවයි කියා දෙදෙනාගෙ දෙපා වැඳ යොදුනක් දිගට පෙළගැසි සිටි පෂිත් සමග නික්ම ඒ ගංතෙරටම ගියහ. එසෙ ගිය පිරිසටත් පෙර පරිද්දෙන්ම බණ කියා එහිම රැඳවිය.

දෙවන දවස්හි පුරෝහිත බ්‍රාහ්මණයානෝත් තමන්ගේ ගෙයි පයඝීඩික බන්ධ ගතවී උන්නේ මෙසේ කීය. මාගේ රූපශ්‍රීන් අග්‍ර වූ ජීවිතයටත් වඩා මට ප්‍රිය වූ දරුවෝ සතර දෙන මේ සා මහත් සම්පත් හා රාජ්‍යය හැර පැවිදිවුව, දැන් මම හුදකලා වූයෙන් මනුෂ්‍ය කානුකයන් හා සදෘශවීමි. එබැවින් ගිහි සැපතින් මට ප්‍රයෝජන නැතැයි තබාගෙ භායඝාව කැඳවා කියනුයේ එම්බා සොඳුර, අතු රිකිළි මල්, ගෙඩි තිබෙන ගසට කියනුයේ වෘක්ෂය කියායි. ඒ සියල්ලක් නැති ගසට කියනුයේ කණුව කියායි, ඒ තත්වයට මම දරුවන් නැතිව පත්ව තිබේ. එසේ හෙයින් මට ද දැන් පැවිදිවීමේ තත්ත්වය උදවී තිබේ යයි පවසා තමාගෙ සැට දහසක් පරිවාර බ්‍රාහ්මණයක් කැඳවා ඔවුන්ට කියනුයේ ''පින්වත් බ්‍රාහ්මණයෙනි, මම මාගෙ දරුවන් වෙත ගොස් පැවිදිවෙමි. තෙපි සැවොම කුමක් කරම්ද?'' යි විමසීය. එවිට ඔවුන් එක්ව පවසනුයේ, ''ආචාරීන් වහන්ස, නිරයනම් නුඹ වහන්සේටම පමණක් තිබෙන දෙයක් නොවෙයි. එම නිරාදුක් අපටත් පොදුයි, එනිසා එයින් මිදීම පිණිස ඔබ වහන්සේ සමග අපත් පැවිදි වීමට කැමැත්තෙමි'' යි කීහ. එවිට බමුණු තමාගෙ, සියලු වස්තු බැමිණියට පාවාදී යොදුනක් පමණ දුරට අතුරු සිදුරු නැතිව සිටි බමුණන්ගේ පරිවාර පෂීත් සමග නික්ම දරුවන් හතරදෙනා සමීපයට ගියාය.

එවේලෙ හත්ථිපාල කුමාරයෝ අහසේ පලක් බැඳ ඉඳ තම පියාණන් ඇතුළු පිරිසට ධර්ම දේශනා කළෝය. දෙවන දවස් බැමිණිය සිතන්නේ මගේ දරුවන් සතර දෙන සියලු රාජ්‍ය සම්පත් හැර පැවිදිවීමට ගියේය. ස්වාමි පුරුෂයා ද එසේම තමාගෙ තනතුරද මේසා ධන සම්පත්තියද මම ද හැරදමා පුතුන් ගියමගම තපසට ගියාය. දැන් මමද මේ හුදකලාවේ ඉඳීමේ අර්ථයක් නැත මටත් ඔවුන්ට සේම අර්ථයක් වීම පිණිස මා ගෙ දරුවන් ගිය මගම යමි'' යි සිතා තම යෙහෙළියන් කැඳවා කියන්නී, යෙහෙළියෙනි, මම පැවිදි වෙනු කැමැත්තෙමි, තෙපි කුමක් කියන්නෙහිද? එවිට බැමිණියෝ කියන්නාහු නිරය නම් නුඹ වහන්සේට පමණක් තිබෙන දුක් ගොඩක් නොවෙයි එය අපටත් දුක් ගොඩකියි කිය කියා තම තමන් ගෙ සම්පත් කෙරෙහි අප්‍රසන්නය. උපදවා පෙර කුමාරවරුන් ගිය මාර්ගයටම සපිරිවරින් නික්ම ගියහ.

පෙර පරිද්දෙන් හත්ථිපාල කුමාරයන් අහසෙ එලක් බැඳ වැඩ සිට තම මෑණියන් ප්‍රමුඛ ඒ පිරිසට ද ධර්ම දේශනා කර එහිම නැවැත්වූහ. දෙවන දවස් රජතුමා පුරෝහිත බමුණා නොදැක විපරම් කළ පසු දැන ගැනීමට ලැබුණේ එතුමා පමණක් නොව බැමිණිය ද සියළු වස්තුතාම හැරදමා පැවිද්දට ගිය බවය.

එවිට රජතුමා කියන්නාහු අස්වාමික වස්තු භාණ්ඩ අයිති අපට යයි කියා එම බමුණු පරපුරේ සම්පත් ගැල් යොදා රාජාංගනයෙහි ගොඩ ගසන්නේය. එකල්හි රජ බිසව ඒ දැක විමසා බලනුයේ කරුණු කාරණා දැන මේ මෝඩ රජා යම්කිසි උපායකින් හැර යථාර්තය අවබෝධ කරවීමට නොහැකැයි සිතා එක් උපායක් යෙදීය. ඒ මෙසේයි.

මස් විකුණන ස්ථානවලින් මස්ගෙණ රාජාංගනයෙහි රැස්කර වටදැල් ඇද්දවූවාය. අහසේ ගොදුරු සොයමින් පියාසර කරණ ගිජුලිහිණියො සමූහයක් එම මස් දැක එතනට බැස්සෝ ය. ඒ අතර නුවණැති ගිජුලිහිණියො දැල් ඇද තිබෙනු දැක කෑ මස් වමනය කොට දැල් කොටුවලින් අපහසුවෙන් නමුත් පැන ගියහ. නුවණැති පක්ෂීහු මස්වලට ලෝභව ගිජුව ගිලදමා බඩ මහත්ව පලායාමට නොහැකිව දැලෙහි පැටලී උන්හ.

එසේ දැලෙහි පැටලී සිටි ලිහිණියන්ගෙන් එකෙකු ගෙන ගොස් බිසවුන්ට පෑහ. බිසවුන්ද එම පක්ෂියා රැගෙන රජ්ජුරුවන් සමීපයට ගොස් මෙය

බලනු මැනව, රාජාංගනයෙහි එක් ක්‍රියාවක් බැලුව මැනව යි කියා සීමැදුර කවුළුහැර පෙන්වන්නී, මෙයින් මේ නුවණැති ලිහිණියො දූල් ඇද තිබෙනු දැක කෑ මස් වමාරා ශරීරය සැහැල්ලු කරගෙන දූලෙන් බේරී පැන ගියහ. මස්කෙරෙහි ලෝභයෙන් කටබඩ පුරා මස්කා කෑදරකම නිසා ඒවා ඉවත් නොකර දූලෙහි පැටලී සිටින ආකාරයත් මාගෙ අතේ සිටින ආකාරයත් පෙනේද?

එපරිද්දෙන් බමුණු වස්තුකාම කෙලශකාමයන් වමාරා කෙලෙස් නැමැති දූලෙන් ගැලවී ගියේය. නුඹ වහන්සේ ගිජුලිහිණියන් වමාරණ ලද වස්තුව නැවත අනුභව කරණ කලක් මෙන් මෙහි ගෙන්වන සේක. තෘෂ්ණා වසඟ වූ අඥාන වූ පුද්ගලයෝ බුද්ධාදි මහෝත්තමයන් විසින් ප්‍රශංසා කරණ ලද්දහු නොවෙති. බිසවුන් කී බස් අසා රජ්ජුරුවෝ මහත් සංවේගයට පත්ව භවත්‍රය ගිනිගෙණ දැවෙන කලක් පරිද්දෙන් වැටහුණේය.

එසේනම් මමත් මේ සියලු රජ යස ඉසුරු පිළිකුලෙන් ඉවත දමා පැවිදිවන්ට පෙරමග පෙන්වන මාග්‍රෝපකාරයෙතැයි සිතා, බිසවුන්ට ස්තුති කරන්නා වූ රජතුමා මෙලෙසකියත්. දියෙහි ගිලෙන්නා වූ පුරුෂයෙකු ශක්ති සම්පන්නයෙක්, දියෙන් ගොඩට ගන්නා සේ මමද දේවිය විසින් අන්ධකාරයෙන් ආලෝකයට ඇද ගත්තා සේයයි ගුණ කියා, අමාත්‍ය මණ්ඩලය රැස් කොට අමාත්‍යයෙහි මම හත්ථිපාල කුමාරයන් සමීපයට ගොස් පැවිදි වෙමි. කැමති කෙනෙක් රාජ්‍යය කරවයි කීයේය. එවිට අමාත්‍යයෝ දේවයන් වහන්ස, තිරය ඔබ වහන්සේට දූක්ද? අපටත් එසේම ය කියා රජතුමාගෙ සපිරිවර යොදුන් තුනක තරම් දිගට පෙළගැසී රජතුමා ද හත්ථිපාල කුමාරයන් සොයා ගංතෙරට ගියහ. එම අවස්ථාවේදී ද රජතුමා ප්‍රමුඛ මහා සේනාවට ධර්ම දේශනා කර ඔවුන් ද එහිම නැවත්වූහ.

පසුද නුවර රැඳුන සත්වයෝ රාජාංගනයට රැස්ව තමන් ආ නියාව කියා යවා අවසරලදින් රජමාළිගාවට ගොස් බිසවුන් වැඳ, දේවීන් වහන්සේ මේ රාජ්‍යයත් අපත් රැක ගෙන සැපසේ රාජ්‍යය කළ මැනවැයි කීහ. එවිට බිසවු කියන්නාහු, මාගෙ රජ්ජුරුවන් වහන්සේ දෙළොස් යොදුන් බරණැස් නුවර සියලු රාජ්‍ය සම්පත් හැරදමා පැවිදිවන්නට ගියහ. එසේ වූ රාජ්‍ය සම්පත් මට කුමට ද මම ද පැවිදි වන්ට යමි.

පින්වත්නි දිවා රෑ නිස්කාරණයෙ නොගොස් සත්වයන්ගේ ආයු සංස්කාරය ගෙවමින් යන්නාහ. ප්‍රථම වයසාදි තුන්දෙන මද්ද දකී ද කොට්ඨාසය ද අනුක්‍රමයෙන් හරණා මතුමතුයෙහි දසයකට නොපැමිණ එහිම වන්නාය. එබැවින් දරුවන් මැඩීමෙන් ගිහිකම්කටුල්ල මුහුකරණ තුරු හුදකලාව තපස් දම් රකින්ට යමි'යි කියා අමාත්‍ය මණ්ඩලයාගේ භාර්‍යාවන් කැඳවා මම පැවිදිවෙමි. තෙපි කුමක් කරවුදයි විචාරා බිසවුනි වහන්ස නුඹ වහන්සේ තපසට යන කළ අපි කුමකට රඳම්ද2? කැටුවම යම්හයි කී කල්හි බිසව, යහපතැයි, ගිවිස රජගෙයි රන් රුවන් මුතු මැණික් පිරුණු ගෙවල්වල දෙරවල් අරවා අසවල් අසවල් ස්ථානවල මෙවන් මෙවන් නිධානයන් ඇතැයි රන්පත්වල ලියවා මේ වස්තු අපේ කැමැත්තෙන් දෙන නිසා කැමති කෙනෙකුට රැගෙන යන්නයි රන්පත ප්‍රදර්ශණයේ තබා තිබුහ. ඒ සා මහත් වස්තු සම්පත් හැරදමා ඒ රජ බිසව සපිරිවරින් නුවරින් නික්මුණාහ.

ඉන්පසු එනුවර ඉතිරි වූ ජනයෝ රැස්ව අපගෙ රජතුමාත් අපගේ රජබිසවත් සියළු රාජ්‍ය සම්පත් හැරදමා තපසට නික්මුණු සේක. දැන් ඉතින් අපි කුමක් කරමෝදයි කථා කොට සම්පත් පිරුණු තම තමන්ගේ නිවෙස්වල දෙර ඇරදමා දරුවන් වඩාගෙන, අතින් අල්ලා ගෙන තම නිවෙස් වස්තු කෙරේ කිසි ඇල්මක් නැතුව ගඟක් පහතට ගලා බස්නා සේ, හත්ථිපාල කුමරුවන් යම් ස්ථානයකද ඒ දෙසට ගමන් කළහ. ඒ බිසවුන් වහන්සේගේ පිරිවරත් යොදුන් තුනක් පමණ දුරට සිටියාය.

හත්ථිපාල කුමාරයෝ ඒ ගිය ජනයාට පෙර පරිද්දෙන්ම ධර්ම දේශනා කළේය. ඉන් අනතුරුව දෙළොස් යොදුනක් දිගට එක් රැස් වූ ජන ගංඟාව රැගෙණ හත්ථිපාල කුමාරයෝ හිමාල වනය බලා තපස්දම් රැකීමට පිටත් වූහ. බොහෝ ජනයා එසේ යාම අසා තව තවත් සත්වයන් එම පිරිසට එක්වීම නිසා තිස් යොදුනක් දක්වා අතුරු සිදුරු නැතිව සෙනග සේනාව එක්වූවත් දෙවියන්ගේ දේවානන්ද්‍ර භාවයෙන් එකද සත්වයකුටවත් කිසිම දෙයකින්, කිසිම ආකාරයකින්වත් කිසිම අපහසු තත්වයක්වත් අවුවෙන් හෝ වැස්සෙන් හෝ නපුරු සතා සර්පයන්ගෙන් හෝ පීඩාවක් ඇති නොවීය.

එකල්හි සක්දෙව් රජ මනුෂය ලෝකය බලා හත්ථිපාල කුමාරයන් තපස්දම් රැකීම පිණිස සියලුම ජනයන් සමග හිමාල වනය බලා නික්ම ගිය බව දැක විශ්වකර්ම දිව්‍ය පුත්‍රයාට එපවත් දන්වා එසෙ පැමිණෙන සෑම සත්වයකුගේම අවශ්‍ය කටයුතු බලාගන්නා ලෙස ද දන්වා මනුලොවට එවීය.

සක්දෙව් රජුගෙ උපදෙස් පරිදි පැමිණි දිව්‍ය පුත්‍රතෙම විශාල පන්සලක් මවා ප්‍රව්‍රජිත පරිස්කාරයන් නිර්මිත කොට, ඇතිරිලි පනවා, ඇඳුම් දිවිසම් ආදී සියලු තපස් පිරිකර පිළියෙල කොට එකී එකී පන්සලෙහි වෙන වෙනම සක්මන් මළු පොකුණු, මල්ගස් වැල් ආදියෙන් ද පළතුරු ඖෂධ ආදියෙන් ද සමන්විතව දේවතානු බලයෙන් නිර්මිත කොට, පන්සල් දෙරකඩ ප්‍රව්‍රජිත පරිස්කාරය තබා යම් කෙනෙක් මහණවනු කැමති නම් මේ සියල්ල සැපසේ ප්‍රයෝජනයට ගනිත්වා දන්වීම් පුවරු ද එල්වා විශ්වකර්ම දිව්‍ය පුත්‍රතෙම නැවත දෙව්ලොවටම ගියාය.

හත්ථිපාල කුමාරයෝ එක් පියවර සටහන් ඇති මගින් පන්සලට ගොස් නාම පුවරුව කියවා සක්දෙව් රජ අපගෙ අවශ්‍යතාවයන් ඉෂ්ට කර තිබේ යයි දැන ඇතුළට ගොස් තපස් වෙස් ගෙණ කිහිපවරක් සක්මන් කර අවශේෂ ජනයා සවස් වනවිට පැවිදි කරවා ගෙණ, විධාන කරන්නා වූ ළදරුවන් ඇති ස්ත්‍රීන්ට මධ්‍ය පන්සල් සලස්වා, ඉන්අනතුරුව වයස ස්ත්‍රීන්ට පන්සල් සලස්වා, ඉන් අනතුරු දරුවන් නැති ස්ත්‍රීන්ට පන්සල් සලස්වා හාත්පසින් වටකොට පිරිමින්ට පන්සල් සලස්වා වසන කල්හි, පසල් නුවරෙක රජෙක් බරණැස් නුවර රජදරුවෝ නැත්තාහයි නුවරට අවුත් රන් රුවන්, මුතුමැණික් ආදියෙන් සහ ධන ධාන්‍ය වස්ත්‍රාභරණයෙන් පිරුණු නුවර දැක රජ ගෙයි උඩුමහලෙහි තැන තැන ගොඩගසා තිබුණු අපමණ වස්තු සම්භාර දැක මේ සා රාජ්‍ය සම්පත් හැරදමා තපසට ගොස් තිබෙන්නේ තපස්දම් රැකීම රාජ්‍ය සම්පත් භුක්ති විඳීමට වඩා සැප නිසා විය යුතු යයි සිතා, අපත් එසේ නම් එම සම්පත ලබා ගත යුතුයි සිතා එනුවර රැඳී සිටි සුරාසොඬුන්ගෙන් මග විස්තර අසා හිමාල වනයෙ සිටින හත්ථිපාල තාපස තුමා වෙත ගියේය.

බෝධි සත්වයෝ ඒ රජ්ජුරුවන් තපසට ආ නියාව දැන පෙරමගට ගොස් ආකාශයෙහි ඉඳ සරාජික පිරිසට බණ කියා පන්සලට ගෙණවුත් පැවිදි කරවා

වාසය කරණ පරිද්දෙන් පන්සල් සලස්වා ඔවුන්ට නිසි කමටහන් දී වසන කල්හි වෙනත් රජදරුවෝ හය දෙනෙක් බරණැස බලන්ට අවුත් මහත් වූ පුදුමයට පත්ව මේ සා සැපත් හැර තපසට ගියකළ මෙහි තිබෙන යස ඉසුරෙන් අඩකටවත් හිමිකම් නැති අප මෙතුමන්ලා ගිය මග යාම පුදුමයක් නොවෙයි. සිතා අපමහ බෝසතාණන් වහන්සේ වෙතම ගොස් පැවිදි වූහ.

යොදුන් තිස් හතක පමණ ප්‍රමාණයක අතුරු සිදුරු නැතිව පන්සල් පිරුණේය. මේ සා අතිමහත් ජන සමූහයා අතරෙන් කිසිවෙකුට හෝ කාමවිතීකාදියක් සිතූ නම් මහාබෝධි සත්වයෝ ඔවුන් සමීපයට ගොස් බණ කියා කිසුනු පිරියම් භාවනා කොට ඔහු කී පරිද්දෙන් යෙදී අෂ්ට සමාපත්ති උපදවා වසන්නාහ. ඔවුන් අතුරෙන් දෙකොටසක් බ්‍රහ්ම ලෝකයෙහි උපන්හ. දෙකොටසක් සප්තකාම ස්වර්ගයෙහි ඉපිද සැප විඳිනාහුය. තපස්වරයන්ට ඇප උපස්ථාන අත් පා මෙහෙවර කළ මනුෂ්‍යයෝ මිනිස් ලොව ක්ෂත්‍රිය බ්‍රාහ්මනාදී උතුම් කුලයෙහි ඉපිද සැප විඳිනාහුය. ඒ බෝධිසත්වයන් වහන්සේගේ අවවාදයෙහි නොපිහිටි සත්වයෝ නරකාදී සතර අපායෙහි ඉපිද දුක් විඳින්නාහ.

තවද මෙම තාම්‍රපර්ණිදීපයෙහි පයවිචාල ධර්ම ගුප්ත ස්ථවිරය, කන්දරවාසි පුෂ්‍යදෙව ස්ථවිරය, මලයවාසි සංඝරක්ෂිත ස්ථවිරය, මලියමහදේව ස්ථවිරය, භග්ගුලවාසි මහාදේව ස්ථවිරය, නරග්ගලවාසි මහාදේව ස්ථවිරය කාලවල්ලි පබ්භාරවාසි ස්ථවිරය, මණ්ඩලවාසි නාග ස්ථවිරය, යන මහා ස්ථවිරයෝද, බුද්දල සමාගමය, මූගපක්ඛ සමාගමය, චුල්ල සුතසෝම සමාගමය, අයෝඝර සමාගමය. හත්ථිපාල සමාගමයෙහිදී සියල්ලටම පසුව නික්මුණු පිරිස් වන්නාහයි, භාග්‍යවත් වූ බුදු රජාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්ව වැඩහිඳ මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදරා පූර්වාපරසන්ධි ගලපා නිමවා වදාළ සේක.

එකල්හි ඒ සුකාරි රජ නම් දැන් සුද්ධෝදන නම් රජතුමාය ඒ රජතුමාගෙ පුරෝහිත බමුණා නම් මෙකල කාශ්‍යප මහරහතන් වහන්සේය. අජකුමරා නම් මේ අනුරුද්ධ ස්ථවිරය, එකල්හි ගොපාල කුමරුනම් මෙකල්හි මුගලන් මහා රහතන් වහන්සේය, එකල්හි අශ්වපාල කුමාරනම් දැන් මේ ශාරිපුත්‍ර ස්ථවිරය, එකල්හි මහ පිරිස නම් දැන් මේ බුදු පිරිසමය, එකල්හි සතිස් යොදුනක ගැවසී සිටියාවූ තාපස පිරිසට ගුණදෙවු හත්ථිපාල බෝධිසත්වයෝ නම් බුදු වූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

# සංඝ සමාජයේ සමගිය යහපතකි

සුඛා සංඝස්ස සාමග්ගි සංඝයාගේ සමගිය සැපතක් බව බුදුරජාණන් වහන්සේ වදරා තිබේ. සංඝ සමාජයේ පැවැත්ම ඇති වන්නේ සමගිය හේතුවෙනි. එහෙයනි සංඝයාගේ සමගිය සැපතකි. යහපතකි.

බුදු රජාණන් වහන්සේ ප්‍රාග් බෞද්ධ ඉන්දියාවේ පහළ වූ විප්ලවවාදී ශාස්තෘවරයෙකි. උන්වහන්සේ විප්ලවවාදියෙකු වූයේ වෛරය මුල්කරගත් ආයුධ සන්නද්ධ පුද්ගලයකු ලෙස නොවේ. උන්වහන්සේ අහිංසාව කරුණාව මෛත්‍රිය ආදී ආයුධවලින් සන්නද්ධ වූ විප්ලවවාදියෙකි. හින්දු පවුලට ඉපදී බ්‍රාහ්මණ දහම උගත් උන්වහන්සේ පහළ වූයේ බහුදේව වාදයෙන් ඒකදේවවාදයට සංක්‍රමණය වූ සමාජයකය. ඒ සමාජය වර්ණ භේදයෙන් භේදභින්නව සිටියේය. බ්‍රාහ්මණයා සමාජයේ ඉහළම තත්ත්වය අත්පත් කර ගත්තේය. ක්ෂත්‍රියා රාජ්‍ය පාලන බලය ලබා ගත්තේය. වෛශ්‍යයා වෙළ හෙළඳාමේ ව්‍යාපාරික ප්‍රජාවේ බලය ලබාගත්තේය.

සියලු කුලයන්ගෙන් පහළ කුළවලට අයත් වූ ශුද්‍රයා කාගේත් මෙහෙකරුවා විය. කාටත්වඩා පහළ තැනැත්තා විය. එහෙත් බුදුරජාණන් වහන්සේ මේ සියලු දෙනාට දැක්වූයේ සම මෛත්‍රියකි. සම දයා කරුණාවකි. මේ සකල විධ කුලයන්හි පිරිස් තම ශාසනයේ මහණ කරන්නට තරම් උන්වහන්සේ අදීන විය. නිර්භීත විය. ඒ අදීනත්වය නිසා එකම ධර්ම සභා මණ්ඩපයක සතර කුලයෙන් පැමිණ පැවිදි වූ මහ තෙරවරු එකට වාඩිගෙන සිටියහ. භාරතයේ පවතින ගංගා යමුනා අචිරවතී, සරභූ මහී යන ගංගාවන් විවිධ මුවදෙරින් සාගරයට පිවිස එකම ලවණ රසින් යුත් ජල කඳක් බවට පත්වන්නාක් මෙන් සිව් කුලයෙන් පැමිණ පැවිදි වූ සියල්ලන් එකම ශාස්තෘන් සාමාජිකයෝ බවට පත්වූහ. මෙබඳු විවිධතාවන්ගෙන් ගහණ භික්ෂු සමාජයක සමගි සම්පන්න භාවය රැක ගැනීම පහසු කරුණක් නොවන බව පැහැදිලිය. මේ භික්ෂු සමාජයේ සමගිය උදෙසා බුදු රජානන් වහන්සේ විය පැහැදම් කළේ ධර්මය පමණි. ධර්මය තුළින් භික්ෂූන් සමගි කරන්නටත් ධර්මානුකූලව ලෝකයේ කිසිදු උස් පහත් භේදයක් නොමැති බව පසක් කරන්නටත් උන්වහන්සේ සමත් වූහ. ඒ උත්සාහය ඉතා වැදගත් ආභාසයක් යැයි අපට සිතෙන්නේ අවබෝධය තුළින් ඇතිකර ගන්නා ක්‍රියාදමය සාර්ථක වන බැවිනි. බුදුරජාණන් වහන්සේ දරදඬු විනය නීති, දඬුවම් භික්ෂු සමාජයේ පැවැත්ම වෙනුවෙන් භාවිතා කළේ නැත. කලාතුරකින්

ඉතා අකීකරු භික්ෂුවක් වෙනුවෙන් විනයානුකූලව කටයුතු කළත් උන්වහන්සේ සැමවිටම ධර්මාවබෝධයෙන් සියල්ලන් සමගි කිරීමට උත්සුක වූ ශාස්තෘවරයෙකි."

බුදුරජාණන් වහන්සේ සංඝ සමාජය නිර්මාණය කළේ පුරුෂ කේන්ද්‍රියව නොවේ. එවක භාරතීය සමාජයේ නොවැදගත් තැනක් ලැබ සිටි කාන්තාවන් වෙනුවෙන් ද උන්වහන්සේ සිය ශාසනයේ දෙර කවුළු හැරදුන්නේය. එය කාන්තා විමුක්තිය පිළිබඳ පරමාර්ථයකි. කාන්තාවන් පැවිදි කිරීමේ දී සංඝ සමාජය තුළ අර්බුද ඇතිවීමේ ඉඩකඩ අවම කිරීමටත් භික්ෂූන් වහන්සේට නිසි ගෞරවය ලබාදීමටත් උන්වහන්සේ පෙරමුණ ගත්හ. ඒ නිසාම භික්ෂු භික්ෂුණී සමාජය තුළ උසස් අවබෝධයක් හා සමගි සම්පන්න භාවයක් ඇතිවිණ.

බුදුරජාණන් වහන්සේගේ දහම් ස්වකීය ජීවිතය තුළ අර්ථවත් කරගත් කිසිවෙකු කිසිවිටෙකත් වැරදි මාවතක ගමන් කර නැත. ජීවිතයේ අයහපත් තීරණවලට එළඹ නැත. එබඳු පුද්ගලයා තම මිතුරන් හා සමාජය සමග අවබෝධයෙන් කටයුතු කිරීමේ ව්‍යවහාර ඥානය ලබාගෙන ජීවිතය සාර්ථක කර ගත්තේය. සංඝ සමාජය වෙනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇති විනය කර්ම වලිනුත් පෙනෙන්නේ ලෝකෝත්තර අරමුණකට කැපවුණු පුද්ගලයෙකු සතු විය යුතු ආචාරශීලීත්වයයි. එබඳු පුද්ගලයන්ගේ සිරිත් විරිත් වල තිබිය යුතු ක්‍රමික ස්වභාවයයි භික්ෂු සමාජය ග්‍රන්ථ ධූර සහ විදර්ශනා ධූර වශයෙන් කොටස් දෙකකි. ග්‍රන්ථ ධූර යනු ත්‍රිපිටක ධර්මය ආරක්ෂා කරමින් ග්‍රාමවාසීව ජීවත්වන භික්ෂූන්ය. ආරණ්‍ය ගත වී සමථ විදර්ශනා භාවනාවෙහි යෙදී කල් ගෙවන භික්ෂූහු විදර්ශන ධූරය පුරන්නෝය. මේ දෙපිරිසටම නියමිත විනය කර්ම සමුදයක් තිබේ. දින චර්යාවකට අනුකූලව දවස් ගත කිරීම සහ පොහොය කිරීම්, පැවැදි කිරීම් උපසම්පදව ලැබීම ඒ විනය කර්ම අතර වේ. මේ සියලුම විනය කර්ම සෑදී ඇත්තේ ඥාන වෘද්ධ ගුණ වෘද්ධ වයෝවෘද්ධ යතිවරුන්ට ගෞරව සැලසෙන ආකාරයටය. ක්‍රමිකව ආධුනික මට්ටමෙන් පටන් ගෙන මහතෙර නමක දක්වා ගෞරව සැලකීම් විවිධ වේ. ඒ නිසි ගෞරවයම සමගි සම්පන්න භාවයට හේතුවේ. මන්ද සුදුස්සාට සුදුසු තැන ලැබී ඇති බැවිනි. වස් කාලය තුළ පොහොය කිරීමේදී මහ තෙරුන් ඉදිරිපිට තම තමන්ගේ අඩුපාඩු අනාවරණය කිරීමටත් ඉන්පසු ඒවා සකසා ගැනීමටත් ඉඩකඩ ලැබී තිබේ. මේ සියල්ල අන්‍යෝන්‍ය අවබෝධය සහ ගෞරවය ඇසුරින් භික්ෂු සමාජයේ සමගි සම්පන්න භාවය තහවුරු කර ඇත්තේය.

පැවිදි සමාජයේ ඇති මේ අන්‍යෝන්‍ය අවබෝධය මත පදනම් වූ සමගි සම්පන්න භාවය ගිහි ජීවිතයටත් එකසේම අදාළය. ගිහියා විවිධ වූත් විෂම වූත් සමාජයක ජීවත් වන සත්වයෙකි. ඔහුට කටයුතු කිරීමට ලැබෙන්නේ තමාට ප්‍රිය උපදවන මිනිසුන් සමග පමණක් නොවේ. තමා ප්‍රිය කරන අප්‍රිය කරන සකලවිධ මිනිසුන් සමග නිදුකින් වසන්ට ඔහුට හැකියාව තිබිය යුතුය. ඒ සඳහා භික්ෂු සමාජය තුළ ඇති අන්‍යෝන්‍ය අවබෝධය නැමැති සාධකය ඉතා වැදගත් වේ. අන්‍යෝන්‍ය අවබෝධය නැමැති සාධකය ඉතා වැදගත් වේ. අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුත් තැනැත්තාට සමාජ ජීවිතය වංකගිරි තරණය කිරීමක් වන්නේ නැත. මේ තත්ත්වය මෙසේ වුවද භික්ෂු සමාජය පසුකාලීනව යම් දෙදරීම් වලට ලක්වූ බව පිළිගතයුතු සත්‍යයකි. ඊට ප්‍රධාන වශයෙන් හේතු වූයේ නිකාය භේදය වැනි අගතිගාමී පිළිවෙත් ශාසනයට රිංගා ගැනීමයි. ශාසනය මෙසේ දෙදරීම් වලට ලක්වෙද්දී ගිහි ජීවිතයට ද යම් බලපෑම් එල්ල විය. ඒ මෙරට පක්ෂ දේශපාලන ක්‍රමයෙනි. නිදහස ලබන්ට පූර්වයෙහි සිංහල බෞද්ධ ජනවර්ගය ලෙස එකාවන්ව නැගී සිටි අප සමාජය අද භේද භින්න වී ඇති ආකාරය දකින වට ඇතිවන්නේ අති මහත් කලකිරීමකි. මේ භේද භින්නතාවන්ට මූලික හේතුව පක්ෂ භේදයයි. දේශපාලන අගතිගාමීත්වයයි. ඡන්දයෙන් අගතියට යෑමයි. අද මේ තත්ත්වය ඉතා දරුණු ලෙස සිද්ධ වෙයි. මිනී මැරීම් බියවැද්දීම්, මංකොල්ලකෑම් ඇතුළු ප්‍රචණ්ඩ ක්‍රියා බොහොමයකට මුල දේශපාලනයයි.

මුල්කාලීන භික්ෂු සමාජය තුළ තිබූ අන්‍යෝන්‍ය ගෞරවය මුල්කරගත් සමගි සම්පන්න භාවයෙන් ආදර්ශයක් ගැනීමට දූන් සිංහල බෞද්ධ ගිහි සමාජයට කාලය පැමිණ ඇතැයි අපට හැඟේ. සිංහල බෞද්ධයා තවදුරටත් මෙසේ දේශපාලන පිල්වලට බෙදී ඇණ කොටා ගන්නේ නම් මේ සමාජයේ පැවැත්මට එය බරපතල හානියකි. බුදු රජාණන් වහන්සේගේ දේශනාත් මුල්කාලීන පැවිදි සමාජයත් අද නැවතත් අවලෝකනය කරමින් සමගිසම්පන්න ගිහි පැවිදි සමාජයක් ගොඩනගා ගැනීමට කල් පැමිණ තිබේ.

දෙහිවල නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ

**කිරම විමලජෝති හිමි**

# නව අරහාදී බුදුගුණ තුළින් බිහිවූ බෞද්ධ සාහිත්‍ය ප්‍රබෝධය

බුදුන් වහන්සේ ලෝකයේ අනිකුත් ශාස්තෲවරුන් අතරින් අසමසම ශාස්තෲවරයාණෝය. ඒ සඳහා මූලිකවම කාරණා සතරක් බලපා තිබේ. ඉන් පළමුවැන්න වනුයේ උන් වහන්සේගේ උපතින් ඈතට විහිදෙන ඉතිහාසයකින් යුක්ත වීමයි. අනිකුත් ශාස්තෲන්වරුන්ගේ ඉතිහාසය දිවයන්නේ ඔවුන්ගේ පහළවීම දක්වා පමණි. නමුත් බුදුන් වහන්සේගේ ඉතිහාසය බෝධිත්ත්ව අවධිය දක්වාම දිවයන්නකි. දෙවැනි කාරණය වන්නේ උන්වහන්සේ දේශනා කළ ධර්මය ඔස්සේ ලෝකයේ නොයෙකුත් රටවල්වල ශිෂ්ටාචාරයන් ගොඩනැගීමයි. අපේ රටේ, අධ්‍යාපනය දැහැමි රාෂ්ට්‍ර පාලනය, ගොවිතැන්බත් කිරීම ආචාර සමාචාර ධර්ම විධි, වැවයි දාගැබයි, ගමයි පන්සලයි ආදී කොට ඇති දැහැමි කෘෂි ආර්ථිකය ගොඩනැගුණේ මේ ථෙරවාදි බුදුදහම මුල්කරගෙනය. ඒ අනුව ලෝකයේ කිසියම් ශාස්තෲවරයකු මුල්කරගනිමින් කොතැනක හෝ ශිෂ්ටාචාරයක් බිහිවී ඇත්නම් ඒ බුදුන් වහන්සේය. තෙවැන්න දියුණු කලා ශිල්ප පද්ධතියකට හිමිකම් කීමයි. ලෝකයේ කොතැනක හෝ ශාස්තෲවරයකු මුල්කරගෙන කිසියම් කලා ශිල්ප පද්ධතියක් බිහිවී ඇත්නම් එහි ශාස්තෲවරයා වන්නේ නිරතුරුවම බුදුන් වහන්සේය. සිව්වැන්න කිසියම් ශාස්තෲවරයකු මුල්කරගෙන යම් රටක සාහිත්‍යයක් බිහිවී ඇත්නම් ඒ බෞද්ධ සාහිත්‍යවීමයි.

එනිසා බුද්ධ චරිතයේ ඉතා සුවිශේෂී දිනයක් වන අද වැනි වෙසක් පුන් පොහෝ දිනක ඒ බෞද්ධ විවරණයක් කර ගැනීම ඉතා වැදගත්ය. බුදු දහම අපට තිරසර වශයෙන්ම ලැබෙන්නේ මහින්දාගමනයෙනි. එය සාහිත්‍ය සම්බන්ධයෙන් අපට වැදගත් වන්නේ මහින්දාගමනයට පෙර එනම් ප්‍රාග් ඓතිහාසික යුගයේ සාහිත්‍යයක් නොතිබුණු නිසාය. ඒ යුගයේ සාහිත්‍යයක් නොතිබුණේ ලිවීමට භාෂාවක් නැත්නම් පැහැදිලි ලේඛන කලාවක් නොතිබුණු හෙයිනි. මහින්දාගමනයෙන් පසුව එතෙක් නොතිබුණු ඒ භාෂාමය අඩුපාඩුව සම්පූර්ණ වනු දැකගත හැකිය. බ්‍රාහ්මී අක්ෂර මාලාව ඔස්සේ මිහිඳු හිමියන් ගෙනා ඒ බුදු

දහම පසුකාලීනව විවරණය කරගනු දැකගත හැකිය. සිංහල ජාතිය සංවර්ධනය වූ ජාතියක් බවට පත්වන්නට පටන් ගන්නේ එතැන් සිටය.

මිහිඳු හිමියන්ට මුලින්ම වැඩසිටීම සඳහා තනාදුන් ආරාම වන්නේ මිහින්තලේ අටටලෙන්ය. සිංහලයේ මුල්ම අක්ෂර දැක්වෙන්නේ මේ ලෙන් කටාරම් තුළය. මේ ලෙන් පූජා කළ සාධු ජනයා තමන්ගේ නම් ඉතා කෙටියෙන් නිසය ලෙස, උපසික නගය ලෙන (උපාසිකා නාගාවගේ ලෙන) තිස්සගේ ලෙන ආදී වශයෙන් එහි කටාරම් තුළ සනිටුහන් කර ඇති බව අදටත් දැකගත හැකිය. ඒ කුඩා සංකේතාක්ෂරවලින් ආරම්භ වුණු ලේඛන කලාව අවුරුදු හාරසියයක් පමණ ගිය තැන ඉතා දියුණු සෙල්ලිපි දක්වා වර්ධනය වනු ඇත. එහි උච්චතම අවස්ථා දෙකක් හැටියට මිහින්තලා කන්ද දෙපස ඇති මහා පුවරු ලිපි දෙක සහ 5 වැනි සියවසෙන් පසුව එන සීගිරි කැපටත් පවුරේ ලියැවුණු කුරුටු ගී සාහිත්‍යය පෙන්වා දිය හැකිය. සිංහල බෞද්ධ සාහිත්‍යයේ මුල් බීජුවට රෝපණය වන්නේ ඒ අයුරිනි.

රටක ඒ රටේ ප්‍රධාන ආගම හා බැඳුණු සාහිත්‍යයක් ගොඩනැගුණි නම් ඒ මෙරට සිංහල බෞද්ධ සාහිත්‍ය බව අවිවාදයෙන් කිවයුතුය. මෙහිදී සිංහල සාහිත්‍ය බෞද්ධ සාහිත්‍යය යැයි පැහැදිලිව අංග දෙකක් වෙන්කළ නොහැකිය. ඒ නිසා එය සිංහල බෞද්ධ සාහිත්‍ය හැටියට ව්‍යවහාර කෙරේ. මෙහි ප්‍රධාන ප්‍රභේද දෙකකි. ඉන් පළමුවැන්න ක්‍රි.පූ. 3 වැනි සියවසේ සිට 6 වන සියවස දක්වා ලියැවුණු අවිද්‍යමාන වූ සාහිත්‍යයයි. දෙවැන්න ක්‍රි.පූ. 7, 8 වැනි සියවස්වලින් ආරම්භ වී මේ දක්වා ව්‍යාප්ත වී ඇති අද අපට විද්‍යාමාන වන මහා දියුණු සාහිත්‍යයි.

ලංකාවේ මුල්ම සාහිත්‍ය කෘති සමූහය වන්නේ හෙළටුවා ග්‍රන්ථයයි. හෙළටුවා යනු මහින්දගමනයත් සමග මෙරටට පැමිණ අර්ථවත් පාලි බුදු දහමට සිංහල භාෂාවෙන් ස්කස්වුණු අර්ථකථනයි.

හෙළ සාහිත්‍යයේ ඉතා වැදගත් යුගය වන්නේ 7, 8 වන සියවස්වලින් පසුව එළඹෙන විද්‍යමාන සාහිත්‍ය යුගයයි. අද අප කතා කරන සහ හදාරණ මහා සාහිත්‍ය මේ යුගයේ බිහිවූ සාහිත්‍යයයි. ලංකාවේ මුල්ම විද්‍යමාන කෘතිය හැටියට සැලකෙන්නේ 10 වන සියවසේදී ලියැවුණු දම්පියා අටුවා ගැටපදය, නමැති ග්‍රන්ථයි. සිඛවලඳ විනිස, ජාතක අටුවා ගැටපදය, අවද සන්නය,

ධර්මප්‍රදීපිකාව හා විශුද්ධමාර්ග සන්නය යනු ඉන් සමහරෙකි. දම්පියා අටුවා ගැටපදය, ධම්ම පදය විස්තර කරමින් ලියැවුණු ග්‍රන්ථයි. භික්ෂූන් වහන්සේලාගේ ශික්ෂාපද විස්තර කෙරුණු ග්‍රන්ථය සිඛවලඳ විනිසයි ජාතික පාලිය කියවා තේරුම් ගැනීම අසීරු නම් ඒ සඳහා පද විස්තර කර ඇති කදිම ග්‍රන්ථය වන්නේ ජාතික අටුවා ගැටපදයයි. අටද සන්නය ද ජාතක කතා අටක් සඳහා ලියන ලද විස්තර වර්ණනාවකි. ධර්මප්‍රදීපිකාව යනු මහා බෝධි වංශයට ලියන ලද පරිකතාවයි. මේ ආකාරයේ විශාල ආඛ්‍යාන ග්‍රන්ත රැසක් අප සතුවන බව පැහැදිලි කරුණකි.

බුදුගුණ වර්ණනා කළ සාහිත්‍ය ග්‍රන්ථ අතර 10 වන සියවසේදී දෙවැනි සේන රජු විසින් සිංහලයට පරිවර්තනය කරන ලද සියබස්ලකර කෘතිය ඉන් ප්‍රධානය. එය දණ්ඩින්ගේ කාව්‍යාදර්ශය නමැති සංස්කෘත ග්‍රන්ථයේ පරිවර්තනයකි. එහිදී සේන රජු විශේෂ නීති පැනවීමක්ද කරනු දැකගත හැකිය. එනම් ලංකාවේ ලේඛකයකු සාහිත්‍යකරණයේදී අනිවාර්යයෙන්ම ඒ සඳහා වස්තු විෂය කරගත යුත්තේ බුදුදහම හෝ බුදු සිරිත බවයි. පෙදෙන් බුදුසිරිත බසින් වත් සිරිත් ඈ. යනුවෙන් සියබස් ලකරේ මුලින්ම සඳහන් කිරීමෙන්ම එය ගම්‍ය වේ.

මේ මග අනුගමනය කළ අපේ පසුකාලීන ලේඛකයන් සාහිත්‍ය කෘතියක් නිර්මාණය කිරීමට යාමේදී ඒ සඳහා කදිම තෝතැන්නක් කරගෙන ඇත්තේ බුදු සිරිත නැත්නම් ජාතක කතාය. ඒ අනුව නව අරහාදි බුදුගුණවලින් වැඩි ප්‍රමාණයක් අපේ ලේඛකයන්ගේ අවධානයට ලක්වී ඇති බව පැහැදිලි කරුණකි. එවැනි අවධානයක් ගත් මහා පඬිවරයා වන්නේ ගුරුළුගෝමී පඩිවරයාණෝය. එද පොළොන්නරු යුගයේ තත්කාලීන හින්දු බලපෑමෙන් යටපත් වුණු අපේ සමාජයට බුදුන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය උන් වහන්සේගේ කාරුණික ස්වභාවය, නිර්භීත ස්වභාවය, මානුෂික ස්වභාවය ඒ සියල්ලක්ම විසතර කරනු පිණිස උන් වහන්සේගේ පුරුෂධම්මසාරථී ගුණය ගෙන අමාවතුර නම් විශිෂ්ට ගද්‍ය කෘතිය කරුණු දැකගත හැකිය. මේ යුගයේ සිටි සමකාලීන අනෙක් පඬිවරයා වන විද්‍යා චක්‍රවර්තී ශුරීන්ද නව අරහාදී බුදුගුණ වෙස්සන්තර ආදී ජාතික කතාත් පදක කරගනිමින් බුදුන් වහන්සේ කෙරෙහි අප්‍රමාණ ශ්‍රද්ධාවෙන් යුක්තව සිංහලයෙ මුල්ම විශිෂ්ට නිර්මාණාත්මක සාහිත්‍ය කෘතිය වන බුත්සරණ ලියැවී ඇත. එසේම දඹදෙණි යුගයේ තවත් විශිෂ්ට බුදුගුණ ගායනාවක් සිදුවනු දැකගත

හැකිය. ඒ බුද්ධපුත්‍ර හිමි විසින් අරහං බුදු ගුණය පාදක කරගනිමින් ලියන ලද පූජාවලියයි. එයින් බුදු හිමි ප්‍රතිපත්ති පූජාවෙන් වන්දනා කිරීමට සුදුසු බව සනාථකොට තිබේ. රටක රජ කෙනෙකුගෙන් පිදුම් ලද, රාජ්‍ය සම්භාවනා ලද රටක් සැණකෙළි සිරියෙන් යුතුව පිළිගන්නා කෘතියක් ඇත්නම් ඇත්තටම එය පූජාවලිය බව නොකියමනාය. සාරාතාථ සංග්‍රහයද නුවර යුගයේ වැලිවිට ශ්‍රී සරණංකර හිමිපාණන් විසින් බුදුන් වහන්සේගේ සත්ථා නමැති ගුණය කුළුගන්වමින් ලියන ලද ඉතා විශිෂ්ට ගද්‍ය කෘතියකි.

මීට අමතරව බුදු ගුණෙන් එහාට ගොස් දහම් සරණ, සග සරණ ආදී තෙරුවන් ගුණ ඇතුළත් විශිෂ්ට කෘති සමුදයක් ද අප සතුවන බව කිවයුතුය.

බුදුසිරිත නැත්නම් බුද්ධ චරිතයේ විශේෂ අවස්ථා මුල්කරගෙන විශිෂ්ඨ සාහිත්‍ය කෘති රැසක් ද රචනා වනු ඉතිහාසය තුළින් දත හැකිය. එයින් විශිෂ්ටතම කෘතිය වන්නේ ධර්මසේන හිමියන් ලියූ සද්ධර්ම රත්නාවලියයි. මෙහි ඇති වැදගත්කම වන්නේ මිනිසුන්ගේ මහා දුර්වලතා නොව පොදු සාමාන්‍ය දුබලකම් සාකච්ඡා කිරීමයි. එසේම ධර්මකීර්ති හිමියන් විසින් ලියන ලද සද්ධර්මාලංකාරය කෘතියද පරිත්‍යාගශීලී ජන සමාජයක් මූලිකවම ගොඩනගා ගැනීමට ඉවහල්වන සිහිපත් කළ යුතුය. සද්ධර්මරත්නාකරය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ධර්මය ආකාරයක් බඳු කෘතියකි. එහි කතුවරයා වන්නේ විමලධර්ම කීර්ති හිමිපාණන්ය. මේ සද්ධර්මරත්නාවලිය සද්ධර්මාලංකාරය. සද්ධර්මරත්නාකරය යන කෘති තුනම බුදු සිරිතට සමීප වූ අවස්ථා ගෙන එයින් ජන සමාජයට ප්‍රබල පාඩමක් ඉගැන්වීමටත් ඒ ඔස්සේ ධර්මයේ සියුම් තැන් මිනිසුන්ට කියාදීමටත් භාවිත කළ හැකි ඉතා වැදගත් විශිෂ්ට කෘති හැටියට ඇගයුම් කළ හැකිය.

පන්සිය පනස් ජාතක පොතට සිංහල සාහිත්‍යයේ ඉතා සුවිශේෂී තැනක් හිමිවන බව අමුතුවෙන් කිවයුතු නොවේ. මෙය බෞද්ධ සාහිත්‍යයේ විශාලතම කෘතිය සඳ වන්දනීය කෘතිය වනවා පමණක් නොව ලෝකයේ විශිෂ්ටතම කතා සංග්‍රහය හැටියට අදත් පිළිගනු ලබන්නේ මෙයයි. මනුෂය සමාජය සුචරිතවත් කිරීමට, මිනිස් සමාජයේ පොදු අඩුපාඩු දුර්වලතා සකස් කර ගැනීම. මිනිසුන්ට සාරධර්ම ඉගැන්වීමට මනුෂ්‍යත්වය කියාදීමට මිනිස් සිතේ ඇති කූටභාවයත් දරුණුකමත් පැහැදිලි කර දීමට ජාතක පොත හැරුණු විට වෙනත් කෘතියක් නොමැති තරම්ය.

මඛාදේව ජාතකය මුල්කොටගෙන මුවදෙව්දවත සහ සස ජාතකය මුල්කරගෙන සසදවතද කුස ජාතකය මුල්කරගෙන කව්සිළුමිණ වැනි පද්‍ය කෘති දහම්සොඬ කාව්‍ය වැනි ජාතක කතා මුල්කර ගනිමන් ලියැවුණු විශිෂ්ට පද්‍ය කෘති සමූහයක් අප සතුවන බව කිව යුතුය. මෙහිදී කාව්‍යශේඛරය කව්සිළුමිණ වැනි කාව්‍ය ග්‍රන්ථ තුළින් අපේ සාහිත්‍ය සතු පොහොසත්කම මෙන්ම අපේ ලේඛකයන් සතු ප්‍රඥාවන්තභාවය, කාව්‍යකරණයේ තිබුණු නිපුණත්වය ලොවට හඬගා කියන්නකි. මීට අමතරව බුදුගුණ අලංකාරය, ලෝවැඩ සඟරාව වැනි විශිෂ්ට කෘති දෙස බැලූවත් ඒවායෙන් කියවෙන්නේ මේ උතුම් බුදුගුණ මහිමයයි.

වංශකතා සාහිත්‍ය බුදුන් වහන්සේගේ පූජනීය වස්තු මුල්කොටගත් සාහිත්‍ය කෘති වන්නේය. බෝධිවංශය, දළද වංශය, ලලාටධාතු වංශය, කේශධාතු වංශය, ථූපවංශය මේ සඳහා වස්තු විෂයන් වී ඇත්තේ බුදුන් වහන්සේගේ ශාරීරික ධාතූන් හා උන්වහන්සේ පරිහරණය කළ වස්තූන්ය.

අවසන් වශයෙන් මේ සිංහල බෞද්ධ සාහිත්‍යය ලෝකයේ ඇති දියුණුව සාහිත්‍ය බව ප්‍රකාශ කරන අතර, එය තත්කාලීන මිනිසුන්ගේ ශ්‍රද්ධාව, ප්‍රඥාව, නිර්මාණාත්මක කුසලතාව, සාරධර්ම, උතුම් පුරුෂාර්ථ ගවේෂණය කිරීමට මැන දැක්වීමට යොදගතහැකි සාහිත්‍ය සම්ප්‍රදයක් හැටියට ඇගයුම් කළ හැකිය.

**කොළඹ විශ්වවිද්‍යාලයේ, සිංහල අධ්‍යයන අංශයේ**

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**

**අගලකඩ සිරිසුමන හිමි**

# ගව මස් කන
# දෙර දිය එපා
## (1985.08.15 බුදුසරණ)

තලා කෙවිට ගෙන බැරිඳ වැඩ යන්න
සිඳුවෙයි ''අහෝ'' මට මස් මඩුවට යන්න
මා කළ වරද කිම මෙතරම් වද දෙන්න
අවසර පතමි මිනිසුනි දුක පවසන්න

ගොවිතැන පිණිස මාගෙන් ඉටුවන සේ වේ
මිනිසුනි ඇයි ඔබට අද අමතක වූයේ
හද සෝ සුසුම් වැල් නිති සුළඟට පාවේ
මොන සිතකින් ද ඔබ අපගේ මස් කෑවේ

පෙම්බර මිනිස් පුත ලේ ටික කිරට පෙරා
දුන් මා ඔබ ව අමතමි නෙත් කඳුලු පෙරා
කන්නට ඔබට මගෙ හදවත් කැවුතු ඉරා
යන්නම් ඉතින් දූන් මම මස් මඩුව කරා

පස් ගෝ රසින් ලේ කිරි කර දුන්න තනේ
යම් කිසි දිනක බත් පිඩ රස කරනු පෙනේ
කොහොමද ලොවට මේ දුසිරිත් පුරුදු උනේ
මිනිසුන් අද මොකද මෙතරම් දරුණු උනේ

දරුවන් ඉතින් පවසමි මම සෙනෙහෙ පපා
මැරුණත් උගුර කට වියලී දෙතොල හපා
ගරු සරු නැතුව ගවයන් මස් බුදින කපා
නිවසක වැදී ඇල් දියවත් බොන්න එපා

වැලිමඩ ටියුඩර් සුදසිංහ



ඔබ වද හිංසා කර මරා දමනවාට ඔබ අකමැති වෙනවා මෙන්ම, අන් සතුන් ද වද හිංසාවට සහ මරණයට අකමැතියි. තමන් උපමා කරගෙන අනුන්ට වද හිංසා කිරීම නොකළ යුතු බව බුදු වදනකි. යම්කිසි වෙළඳ ව්‍යාපාරිකයෙකුට පාරිභෝගිකයාගෙන් ලැබෙනුයේ විශාල සහයෝගයකි. එසේ නම් මාංශ පරිභෝගිකයින් සත්ත්ව ඝාතනය කරන්නන්ට එක්තරා මට්ටමකින් සහයෝගයක් නොදේදැයි සිතා බලන්න. ගැණුම්කරුවන් වැඩිවන තරමට නිෂ්පාදනය වැඩි කරනු ලබයි. සතුන් මරලා ගෙනත් තියන්න. අපි ගෙනියන්නම් නොකියා කීම සත්ත්ව ඝාතකයා ධෛර්යමත් කිරීමක් නොවන්නේද....

මුද්‍රණය : තිරසවි ප්‍රින්ටර්ස් 0112 569192, 077 9620359